# *විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය (CPA) විසින් මහජන නියෝජන කොමිෂන් සභාව වෙත කරනු ලබන මූලික ඉදිරිපත් කිරීම*

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් (CPA) ඉදිරිපත් කරනු ලබන මෙම ඉදිරිපත් කිරීම ශ්‍රී ලංකාව සඳහා නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය විසඳුමක ස්වභාවය හා ආකෘතිය පිළිබඳ අපේ පොදු අදහස් සැකෙවින් සනිටුහන් කරයි. එය වර්තමානයේ මහජන විවාදයට භාජනය වෙමින් පවතින හා ආණ්ඩුව වෙනස් කිරීමට හා නව ව්‍යවස්ථාවක් පැනවීමට වත්මන් පාර්ලිමේන්තුවට බලය දීමේ 2015 ඓතිහාසික මැතිවරණ දෙකේ දී ම ශ්‍රී ලාංකීය ජනතාවගේ ප්‍රජාතන්ත්‍රීය තීරණය තුළ සංලක්ෂිත වූ ප්‍රධාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය ප්‍රශ්න පිළිබඳව අවධානය යොමු කරයි. මහජන නියෝජන කොමිෂන් සභාව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලය හා/හෝ පාර්ලිමේන්තුව එලෙස ආරාධනා කරන්නේ නම් වාචිකව හා ලිඛිතව වඩාත් විස්තරාත්මක පැහැදිලි කිරීම් හා යෝජනා ඉදිරිපත් කරන්නට අප සූදානම් ය.

## *මූලික මූලධර්ම*

නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ව්‍යවස්ථාමය ආණ්ඩුකරණයේ, බහු සංස්කෘතික පුරවැසිභාවයේ, ස්ත්‍රී පුරුෂ සමාජභාවී සාධාරණත්වයේ හා බහුත්ව ප්‍රජාතන්ත්‍රවාදයේ සාරධර්මවලට ගරු කිරීමේ බලගතු සංස්කෘතියක් සඳහාවන ආපසු හැරවිය නොහැකි පදනම සපයන සේ එය පදනම්වන මූලික ප්‍රතීයමාන මූලධර්ම පිළිබඳ සංගත ප්‍රකාශනයක් අඩංගු කර ගත යුතු ය. ශ්‍රී ලංකාවේ බහුවිධ ප්‍රජාවන් අතර විශ්වාසය ගොඩ නැගීමට නම් නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ක්‍රමය සියලු පුරවැසියන්ට හිමිකම සම්බන්ධයෙන් ද එනයින් නව ශ්‍රී ලංකා රාජ්‍යයට කැපවීම සම්බන්ධයෙන් ද දැනීමක් ලබා දීමට ඉලක්ක කළ යුතු ය. මෙම සන්දර්භය තුළ 1972 සිට ජනරජ ව්‍යවස්ථා දෙකෙහිම සංලක්ෂිත කර තිබෙන බුද්ධාගමට හා රාජ්‍යයේ ඒකීය ස්වභාවයට ප්‍රමුඛස්ථානය දීමට අදාළ විධිවිධාන ශ්‍රී ලාංකීය රාජ්‍යයේ බහුත්වවාදී සමාජ පදනම්වලට අනනුකූල බව  අපේ අදහස ය. අපේ සමාජය ඓතිහාසික වශයෙන් සංස්කෘතීන්, ජනවර්ග හා ආගම් වශයෙන් ගත් කල ඉහළ අන්දමින් බහුත්වවන අතර ඊට එවැනි බහුත්වවාදී බවක් පැවතී තිබේ. සිංහල ජනයා හා බෞද්ධාගම අපේ දිවයිනේ ඉතිහාසයෙහි ප්‍රමුඛත්වයක් බුක්ති විඳ තිබෙනවා සේ ම දිවයින තුළ දිගු ඉතිහාසයන් සහිත විවිධ සුළුතර කණ්ඩායම් ද ඔවුන් ද කොටසක් වන රාජ්‍යය සමග විවිධ සබඳතාවන් අපේක්ෂා කරති. නිදසුන් ලෙස උතුර හා නැගෙනහිර දමිළ ජනයා භූමි

ප්‍රාදේශික ස්වයං පාලන පියවරක් අපේක්ෂා කරන අතර මුස්ලිම්වරුන් හා අනෙකුත් සුළුතර ජන කොටස් වෙනත් ආකාර ඉඩ ප්‍රස්ථා අපේක්ෂා කරති. තව ද අපේ ප්‍රජාවන් සියල්ලෝම ශ්‍රී ලංකාවේ දේශපාලන හා සංස්කෘතික විචිත්‍රයට (Mosaic) නෛසර්ගිකවන පරිදි පිළි ගැනීම හා ඇගයීම අපේක්ෂා කරති.

බහුත්ව දේශපාලන ක්‍රමයක ව්‍යවස්ථාමය රාජ්‍යයේ ප්‍රධාන කාරණය හා කාර්යය වන්නේ එය දේශපාලන ක්‍රමය තුළ හුදෙක් වාර්ගික බහුතරය හෝ වෙනත් දේශපාලන බහුතරය නොව සාමුහිකව සංස්ථාපනය වන සියලු කණ්ඩායම් පිළිගන්නා බව, නියෝජනය කරන බව හා ඉඩ ප්‍රස්ථා සලසන බව සහතික කිරීම ය. එය ශ්‍රී ලාංකීය පුරවැසිභාවය හා ජාතිකත්වය පිළිබඳ සියල්ල වැළඳ ගන්නා පොදු රාමුවක් ඇතුළත කාණ්ඩ-විභේදිත අයිතිවාසිකම් පිළිබඳ පදනමක් මත සාමුහික හිමිකම්වලට සලකනු ලබන බව හා තනි හා එක්සත් ශ්‍රී ලාංකීය රාජ්‍යයක අභිධානය ඇතුළත ජාතිකත්වය පිළිබඳ බහුවිධ සංකල්ප ව්‍යවස්ථාමය වශයෙන් පිළිගත හැකි වන බව අදහස් කරයි. මෙය බලහත්කාරයේ හා මර්දනයේ අවශ්‍යතාවෙන් තොරව සමාජ සාධාරණය මෙන්ම රාජ්‍යයේ ස්ථාවරභාවය හා සුරක්ෂිතභාවය සහතික කරයි. මේ පදනමින් බලන විට බුද්ධාගම පිළිබඳ වගන්තිය බහුතර ප්‍රජාවට වරප්‍රසාද දෙන අතර යටත් පිරිසෙයින් සංකේතාත්මක වශයෙන්වත් අනෙකුත් ප්‍රජාවන් දෙවන තත්ත්වයකට පහත හෙළයි. ඇතැම් විට වඩා වැදගත් දෙය වන්නේ ඒකීය රාජ්‍ය මූලධර්මය ස්වයං පාලනය සඳහා දමිළ ජනයාගේ හිමිකම් කියාපෑමට අර්ථවත් ප්‍රතිචාරයක් දැක්වීමේ මාවතට හරස්ව පවතින්නක් වී තිබෙනවාය යන්න ය.

හොඳම වන්නේ ''ඒකීය'' ද ''ෆෙඩරල්'' ද වැනි ඒවා අතර ආකෘතිකවාදී වර්ගීකරණයන් පිළිබඳ වැඩකට නැති විවාද මග හැරීම වුව ද විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතීයමාන පදනම් හා ව්‍යුහාත්මක නිර්මාණය බහුත්වවාදය හා බහු-තල පාලනය ක්‍රියාත්මකවන ප්‍රජාතන්ත්‍රවාදී ශ්‍රී ලාංකීය රාජ්‍යයක එක්සත්භාවය හා භූමි ප්‍රාදේශීය අඛණ්ඩතාව සහතික කරන අතරම ඒකීය රාජ්‍යය වැනි බහුතරවාදී මූලධර්ම මගින් වළක්වනු නොලබන විස්තීරණ බලය බෙදීම හා බල පංගුකාරිත්වය සහතික කළ යුතු යයි දැඩි ලෙස විශ්වාස කරයි. එසේම බහුත්වවාදය හා බහු-තල ආණ්ඩුකරණය තත්කාලීන ලෝකයේ යහ පාලනයේ මූලික පැති ලෙස පිළි ගනු ලබන බව අවධාරණය කිරීම වටනේ ය.

නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ සමූහාණ්ඩුවාදයේ, නිර්ආගමිකවාදයේ, දේශපාලන බහුත්වවාදයේ, ව්‍යවස්ථාමය උත්තරීයත්වයේ, නීතියේ ආධිපත්‍යයේ, බලතල බෙදීමේ හා ප්‍රත්‍යන්තයන් කළ යුතු කාර්යයන් කේන්ද්‍රය නොකළ යුතු ය යන මූලධර්මයේ හා සියල්ලටමත් වැඩියෙන් මානව ගරුත්වයේ මූලධර්ම පැහැදිලිව පිළිගත යුතු යයි අපි දැඩි ලෙස නිර්දේශ කරමු. එසේම ශ්‍රී ලංකාවේ සමාජයීය බහුත්වවාදය, අතීතයේ අසාධාරණකම් හා 2015 ප්‍රජාතන්ත්‍රීය නවෝදයේ වැදගත්කම පිළිගන්නා යෝග්‍ය

පූර්විකාවක් ද වැදගත්වනු ඇත. පූර්විකාව හා මූලික මූලධර්ම සියල්ල ගණනයට ගැනීම හා පැහැදිලිව දක්වීම යන දෙකම නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංගත ලෙස අර්ථ නිරූපණය කිරීමේ හා මනාව ක්‍රියාත්මක කිරීමේ පදනම සංස්ථාපනය කරනවා ඇත.

*විධායකය*

ශ්‍රී ලංකාවේ ජනතාව 2015 මැතිවරණවල දී ආණ්ඩුකරණයෙහි විධායක ජනාධිපති ක්‍රමය සම්පූර්ණයෙන්ම අහෝසි කිරීමේ වරම පැහැදිලිව ලබා දී තිබේ. එය හඳුන්වා දීමේ පටන් සදාකාලිකව මෙම ආයතනය විසින් ඇතිදැඩිකර පෝෂණයකර තිබෙන අධිකාරීවාදය, දුශ්පරිපාලනය හා දූෂණය  සැලකිල්ලට ගනිමින් සිවිල් සමාජය මේ සම්බන්ධයෙන් දිගු කාලයක් මුළුල්ලේ අරගල කර තිබේ. නව ආණ්ඩුවේ ඉහළම මට්ටම්වල දී මෙම ක්‍රමය අහෝසි කිරීම සම්බන්ධයෙන් එහි පොරොන්දුව නැවත ප්‍රකාශ කිරීම මගින් අපි දිරිමත්ව සිටින අතරම ඍජුව තෝරාගනු ලබන අගමැතිවරයෙකු මගින් විධායක ජනාධිපති ක්‍රමය ආදේශ කළ හැකිය යන යෝජනා මගින් තැති ගැන්මට පත්ව සිටිමු. එවැනි ප්‍රතිපාදනයක් ගෙන ඒම පාර්ලිමේන්තු හා කැබිනට් ආණ්ඩුක්‍රමයක වඩා සම්මත ආකාරයක විශිෂ්ටත්වයේ සලකුණ හා ප්‍රධාන ශක්තියවන සමාගමීය සාමුහිකත්වය අවශ්‍යව තිබෙන අවස්ථාවක අත්‍යන්තයෙන්ම අසාමාන්‍ය වනවා පමණක් නොව හුදෙක්ම ප්‍රධාන විධායක ධූරයට පුද්ගලයෙකු ඍජුව තෝරා ගැනීම හා අතිනත ගෙන එන ආත්මෝන්නතිය හා අධිකාරිවාදය පුනර්ජනනය කිරීමක් වනවා ඇත. 1947 සිට 1970 දක්වා පැවති අපේ ස්වාධීනතා ව්‍යවස්ථාවේ පිළිබිඹුව තිබූ පරිදි සම්පූර්ණ වෙස්ට්මිනිස්ටර් මාදිලියකට පෙරළා පැමිණෙන්නැයි අපි දැඩි ලෙස ඉල්ලා සිටිමු. එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය අයිතිවාසිකම්, යහ පාලනය, බහුත්වවාදය හා පහතින් සංක්ෂිප්තව දක්වනු ලබන බලය බෙදීම වැනි අනෙකුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය අයිතීන් සඳහාවන නෛතික ආරක්ෂණයන් සහිතව ව්‍යවස්ථාදායකය වෙත විධායකයේ අනවතර දේශපාලන වගවීම සහතික කරනවා ඇත. එවැනි ක්‍රමයක් තුළ නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදයේ හා දේශපාලන වගවීමේ ප්‍රධාන ආයතනය ලෙස ජාතික ජීවිතයෙහි කේන්ද්‍රීය ස්ථානයක පාර්ලිමේන්තුව ප්‍රතිෂ්ඨාපනය කරනවා දකින්නට අපි අපේක්ෂා කරමු. නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සැලස්ම ලැටිමර් හවුස් මූලධර්මවල පිළිබිඹුවන ප්‍රශස්ත භාවිතයන් පිළිබඳ පොදු රාජ්‍ය මණ්ඩලීය ප්‍රකාශනය මගින් මග පෙන්වනු ලැබිය යුතු යයි අපි ඉල්ලා සිටිමු.

**මැතිවරණ ක්‍රමය**

2015 මැතිවරණවල විදහා දැක්වුණු දෙවන ප්‍රධාන ව්‍යවස්ථාමය ප්‍රශ්නය වූයේ මැතිවරණ ප්‍රතිසංස්කරණ හා විශේෂයෙන්ම සමානුපාතික ඡන්ද ක්‍රමයෙහි විවෘත ලැයිස්තු ක්‍රමය අහෝසි කිරීම ය. සමානුපාතික නියෝජන සන්දර්භය තුළ ඡන්ද දායකයාගේ තේරීම වැඩි දියුණු කිරීම සැලසුම් කළ ද භාවිතයේ දී සමානුපාතික ඡන්දය අධිකතර තරගයට, දූෂණයට හා හිංසනයට මග පාදා තිබේ. සිවිල් සමාජය ඇතුළත බහුත්ව සමාජයක නිසි ප්‍රජාතන්ත්‍රවාදී නියෝජනයට අතිශයින් වැදගත්වන සියල්ල වැළඳ ගන්නා  සමානුපාතික

නියෝජන මූලධර්මය ආරක්ෂා කරන අතරම කේවල ක්‍රමයේ යහපත් අංග ඒකාබද්ධ කරන මිශ්‍ර මන්ත්‍රී සමානුපාතික (MMP) ක්‍රමයක් වෙනුවෙන් වැඩෙන එකඟතාවක් ඇති වී තිබේ. මිශ්‍ර මන්ත්‍රී සමානුපාතික (MMP) ක්‍රම පක්ෂ ලැයිස්තු හරහා ව්‍යවස්ථාදායක නියෝජනයේ සමානුපාතිකභාවය සහතික කරන අතරම කුඩා භෞමික ඡන්ද කොට්ඨාස ඇති කිරීම මගින් ඡන්දදායකයා හා මන්ත්‍රීවරයා අතර සමීප සබඳතාවක් සහතික කරයි. නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි එවැනි ක්‍රමයක් ඇතුළත් කරන ලෙස අපි ඉල්ලා සිටිමු.

*අයිතිවාසිකම් පනත*

මූලික අයිතිවාසිකම් පිළිබඳ වත්මන් පරිච්ඡේදය ජාත්‍යන්තර ප්‍රමිතීන් හා ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර බැඳීම් සපුරාලීමේ දී පැති ගණනාවකින්ම අඩුපාඩු සහිතය. එහි අයිතිවාසිකම් ගණන් ගැනීම අසම්පූර්ණ ය. අයිතිවාසිකම්වල විෂය පථය හා ස්වභාවය ප්‍රකාශ කරනු ලබන්නේ ජාත්‍යන්තර ප්‍රමිතීන් මගින් සලසා තිබෙනවාට වඩා පටු හා සීමා කිරීම් කරන අන්දමට ය. සියල්ලටමත් වඩා සීමාවන්ගේ රාමුව පටිපාටිමය වශයෙන් හා හරයාත්මක වශයෙන් යන දෙයාකාරයෙන්ම පිළිගත නොහැක්කා වූ අයිතිවාසිකම් උල්ලංඝනයන්ට ඉඩ සලසයි. එසේම 2015 දී 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් තොරතුරු දැන ගැනීමේ අයිතිය පිළිබඳ නිදහස මූලික අයිතියක් ලෙස හඳුන්වා දීමෙන් සිදු කළ වැඩි දියුණු කිරීම අනෙකුත් සියලුම අයිතීන් සම්බන්ධයෙන් පුළුල් සීමා කිරීමේ වගන්ති පවත්වා ගන්නා අතරම එයට පමණක් අදාළවන සීමා කිරීමේ වගන්තියක ආකාරයෙන් විෂමතාවක් ද හඳුන්වා දී තිබීම ද විරුද්ධාභාසීය. මෙම සන්දර්භය තුළ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය එක්සත් ජාතීන් විසින් පිළිගනු ලැබ තිබෙන ප්‍රධාන මානව හිමිකම් සාධන පත්‍ර දහයෙහි දක්වා තිබෙන ප්‍රමිතීන් සම්පූර්ණ වශයෙන් සපුරාලන හා ඒ ප්‍රමිතීන්ගෙන් ඔබ්බට පවා යන මූලික අයිතිවාසිකම් පිළිබඳ අළුත් ව්‍යවස්ථාමය පනතක් සකස් කරන්නැයි ඉල්ලා සිටී. එසේම අපි ප්‍රධාන ජාත්‍යන්තර මානව හිමිකම් ගිවිසුම් ක්‍රියාවට නැගීම නියාමනය කරන විශේෂඥ කමිටු වන්නා වූ අදාළ ගිවිසුම් මණ්ඩල වෙත බාධා විරහිත ප්‍රවේශය සලස්වන්නැයි ඉල්ලා සිටිමු. මූලික අයිතිවාසිකම් පෙත්සම් සම්බන්ධයෙන් පළාත් මහාධිකරණ ප්‍රථම අවස්ථා අධිකරණ බවට පත් කරන පරිදි අධිකරණ බලතල බෙදීම ඇතුළුව විශේෂයෙන්ම අයිතිවාසිකම් පනතට හා වඩා පුළුල් ලෙස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනනුකූලවන සියලුම නීති, ප්‍රතිපත්ති, භාවිතය හා චර්යාව විස්තීරණ ලෙස අධිකරණ විමර්ශනයට භාජනය කිරීම හා පලදායී රාජ්‍ය පාලන නීති පිළියම් යෙදීම කළ යුතු ය. නව අයිතිවාසිකම් පනත නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සවිමත් කරන පොදු ශ්‍රී ලාංකික පුරවැසිභාවය පිළිබඳ ප්‍රජා සංකල්පය සඳහාවන අත්තිවාරම් පදනම සංස්ථාපනය කළ යුතු ය.

*ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණය*

පළමුවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව (1972-78) යටතේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණයක් සම්බන්ධ අපේ අත්දැකීම විශේෂ වශයෙන් ප්‍රයෝජනවත් නොවන අතර

ප්‍රතිපත්තිමය වශයෙන් එවැනි අධිකරණයක් නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව විශේෂයෙන් නව අයිතිවාසිකම් පනත සම්බන්ධයෙන් වැඩ කිරීමේ දී හා ඒවා ව්‍යාඛ්‍යාන කිරීමේ දී ඉමහත් වැදගත්කමක් ගත හැකි ය. එවැනි අග්‍ර අධිකරණයක් ස්ත්‍රී පුරුෂ සමාජභාවය ඇතුළුව ශ්‍රී ලංකාවේ සමාජයීය හා කලාපීය බහුත්වවාදයේ නියෝජනයක් විය යුතු අතර අධිකරණ නිලධාරීන්ට අමතරව වෘත්තීය විශ්ෂ්ටත්වයකින් යුත් හෝ නීතිය හැර අනෙකුත් අදාළ ක්ෂේත්‍රවල ශාස්ත්‍රීය විශිෂ්ටත්වයකින් යුත් විද්වත් නීතිඥයින්ගෙන් (විශේෂයෙන් දේශපාලන විද්‍යාඥයින්ගෙන්) සමන්විත විය යුතු ය. එමෙන්ම එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය අර්ථ නිරූපණ හා මූලධර්ම පිළිබඳ වැදගත් ප්‍රශ්න සම්බන්ධ නඩු සම්බන්ධයෙන් පමණක් ක්‍රියා කරන අධිකරණයක් විය යුතු ය. එනම් එය අවසාන අභියාචනයන් විනිශ්චය කරන විධිමත් අධිකරණයක් ලෙස කටයුතු *නොකරන* අධිකරණයක් විය යුතු යයි විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විශ්වාස කරයි. කෙටියෙන් කිවහොත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ උත්තරීයත්වය පිළිබඳ මූලික මූලධර්මයේ ආරක්ෂකයා වනු ඇත.

### *බලය බෙදීම*

ශ්‍රී ලංකාවට එහි සමාජයීය බහුත්වවාදය සමග තුල්‍යවන බලය බෙදීමේ හා බලය බෙදාහදා ගැනීමේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය රාමුවක් ස්ථාපිතකර ගැනීමට පූර්ව ස්වාධීනත්ව කාලවල පටන් අසාර්ථකත්වයේ ඉතිහාසයකින් පසු තවත් අවස්ථාවක් ලැබී තිබේ. සන්නද්ධ ගැටුමේ දශක තුනකට අධික කාලයක් ඇතුළු ජනවාර්ගික සබඳතාවන්ගේ නිශ්චිත ඛේදනීය ඉතිහාසය තුළ වත්මන් ව්‍යායාමය හා සම්බන්ධ දුෂ්කරතා අතිශයෝක්තියෙන් කිව නොහැකි ය. එසේ වුව ද මෑත මැතිවරණවල දී උතුර හා දකුණ යන දෙකෙහිම ජනතාව මැදහත් පක්ෂ අතිවිශාල වශයෙන් අනුමත කර තිබෙන්නේය යන කරුණෙන් අපව දිරිගන්වනු ලබන්නේ ය. යටත් පිරිසෙයින් කල්පිත වශයෙන් මෙය සියලු ප්‍රජාවන්ගේ උවමනා එපාකම් විවෘත ලෙස ප්‍රකාශ කළ හැකි හා අන්‍යොන්‍ය ගරුත්වයේ හා අවබෝධයේ පර්යාවලෝකයක සිට නව විසඳුමක් සඳහා සහමන්ත්‍රණයේ යෙදිය හැකි ප්‍රතිපත්තිමය හා කතිකාමය ක්‍රියාවලියක් සඳහා අවකාශයක් විවෘත කරයි. මේ සම්බන්ධයෙන් ගත් කල බලය බෙදීමේ අවශ්‍යතා ප්‍රකාරව උතුර හා නැගෙනහිර අනෙකුත් පළාත්වලින් වෙනස් ලෙස සැලකීමේ අවශ්‍යතාව අපි අවධාරණය කරන්නෙමු. ඒ සඳහා අසමමිතික විධිවිධාන අවශ්‍ය කෙරේ නම් එවිට අපි තත්කාලීන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදක භාවිතයන් මෙන්ම ප්‍රජාතන්ත්‍රවාදය හා සමානත්වය සමග අනුකූලවන පරිද්දෙන් එය සොයා ගත යුත්තෙමු.

එසේම අපි අවකාශීය වශයෙන් හා භූමි ප්‍රාදේශීය වශයෙන් බලයේ හා අධිකාරයේ වඩා වැඩි විසරණයක් මගින් දේශපාලන බලයේ හා නෛතික අධිකාරියේ අධි-මධ්‍යගතකරණයට- විශේෂයෙන්ම යටත් විජිත රාජ්‍යයේ අනර්ථකාරී උරුමයට ආමන්ත්‍රණය කිරීම සැලකිල්ලට ගත යුතුවා සේ ම රාජ්‍යය ප්‍රජාතන්ත්‍රීකරණය කිරීමේ අරමුණුවලට සේවය කළ යුතු ය. ප්‍රජාතන්ත්‍රීය ආයතන අනුක්‍රමිකව දේශපාලන වගවීම ද

මෙයාකාරයෙන් ආර්ථික සංවර්ධනය ද සහතික කළ යුතු ය. බලය වැඩියෙන් සංකේන්ද්‍රණය වන විට රාජ්‍යයක් අඩු ප්‍රජාතන්ත්‍රීය වේ. මෙය රටේ ප්‍රජාතන්ත්‍රීයකරණයේ හා සංවර්ධනයේ අවශ්‍යතාවන් සමග ගෙන බලන විට රැඩිකල් බල බෙදීමක් පිළිබිඹු කරන නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සඳහා ජනවාර්ගික සබඳතාවන් පිළිබඳ ප්‍රශ්නයට ඔබ්බෙන් යන බලගතු තාර්කිකයක් වෙයි.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ඉතිහාසයේ හා නව ශ්‍රී ලාංකීය රාජ්‍යයේ චර්යා ධර්ම තුළ සිංහල-බෞද්ධ බහුතරයට ඔවුන්ගේ නියමාකාර ස්ථානය සහතික කරන අතරම උතුරේ හා විශේෂයෙන් නැගෙනහිර මුස්ලිම් ජනයාගේ ඇතුළු අනෙකුත් සියලු සුළුතර කණ්ඩායම්වල නීත්‍යානුකූල හිමිකම් සමග අනුරූපීවන අන්දමින් ස්වයං පාලනයක් උදෙසාවන උතුරේ හා නැගෙනහිර දමිළ ප්‍රජාවගේ අභිලාෂයන් සපුරන නව බලය බෙදීමේ විසඳුමක් දකින්නට කැමති ය. අප මේ දැක්මෙන් දිරිමත්ව සිටිනුයේ අප සියලු දෙනා යුක්ති යුක්ත ලෙස ආඩම්බරවන වාරි ශිෂ්ඨාචාරයකට උපත දුන් සේ ම ප්‍රධාන රාජ්‍යයෙන් පිටත ප්‍රදේශවලට භූමි ප්‍රාදේශීය ස්වයං පාලනය ඇතුළුව ථෙරවාදී සම්ප්‍රදායේ උසස් ජීවගුණයට අනුකූලව ඉතා සැලකිය යුතු මට්ටමකින් සුළුතර ජනයා සම්බන්ධයෙන් සහනශීලතාව සහතික කළ පැරණි සිංහල-බෞද්ධ රාජධානි සමයේ මණ්ඩල රාජ්‍ය ක්‍රමයන් පැවති පූර්ව යටත් විජිත ඉතිහාසය පිළිබඳ අපේ අවබෝධය මගිනි. විවිධත්වය තුළ එක්සත් වීමේ අපේ වත්මන් අභියෝගයන්ට ආමන්ත්‍රණය කරන විට අපට ඉගෙනගත හැකි පොහොසත් පාඩම් තිබෙන ඓතිහාසික දකුණු ආසියාතික රාජ්‍ය සම්ප්‍රදායේ බලය බෙදීමේ, අසමමිතික හා බහුත්වවාදී ස්වභාවය සමග ගෙන බලන විට මධ්‍යගත ඒකීය රාජ්‍යය යටත් විජිත නිර්මාණයක් පමණක් නොව ඉතා මෑත එකක් ද වන බව අපි සිහිපත් කරමු.

වඩාත් විශේෂිතව අපි 1987 දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හා අදාළ නීතිකරණය මගින් පළාත් සභා හඳුන්වා දීමේ පටන් බලය බෙදීම පිළිබඳ අපේ අත්දැකීමෙන් (විශාල වශයෙන් අසතුටුදායක) පාඩම් උගත යුත්තෙමු. දහතුන්වන සංශෝධනය පිළිබඳ මහජන සාකච්ඡාව ජනවාර්ගික විභේදනයේ දෙපාර්ශවයේම අධිකතර ජාතිකවාදී අලංකාරිකය සේ ම එහි ශක්තීන් හා දුර්වලතාවන් පිළිබඳ සවිස්තර දැනුමේ අඩුවක් ද මගින් නිතරම වාගේ ගොහොරුකර දැමිණ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය සැලසුම සඳහා වඩාත් අවබෝධිත හා නිරාමිෂ ප්‍රවේශයක් අවශ්‍ය කෙරේ. බලය බෙදීම යනු හුදෙක් මධ්‍යම හා පළාත් ආයතනවල වඩා හොඳ තුලනයක් ඇති කිරීම පිණිස පළාත්වලට තීරණ ගැනීමේ බලතල පැවරීමම නොව වගකීම හා වගවීම බෙදීම මගින් බලය බෙදීම ඌනපූරණය කිරීම ය යන්න මේ සම්බන්ධයෙන් වන සියල්ල වැළඳ ගන්නා මූලධර්මය විය යුතු ය. වගකීම හා වගවීම බෙදාහදා ගන්නා එවැනි ප්‍රවේශයක් පළාත් සහ කේන්ද්‍රය එකට එක් කිරීමට සේවය කරනු ඇත.

මෙලෙස මධ්‍යම හා පළාත් ආයතන අතර සංගත තුලනයක් ආරක්ෂා කරන අතරම පළාත් ස්වායත්තතාව උසස් කිරීමේ දැක්මකින් යුතුව ශක්‍යතාවන් බෙදීම මෙන්ම ඒවායේ

කාර්ය සාධනීයත්වය නැවත සලකා බැලිය යුතු ය; ආණ්ඩුකාරවරයාගේ බලතල තේරී පත්වූ පළාත් දේශපාලන විධායකයට පැවරෙන සේ අහෝසි කළ යුතු ය; මුදල් හා මූල්‍ය රාමුව රාජ්‍ය මූල්‍යය නගාලීමේ බලය ඇත්තවුන් ප්‍රජාතන්ත්‍රවාදී ලෙස වගවීම සහතික කරනු පිණිස මූලික වශයෙන්ම (මූල්‍ය සමානකරණයේ ක්‍රියාවලීන්ට ඉඩ සලසන අතරම) යළි සැලසුම් කළ යුතු ය; සමගාමී ශක්‍යතාවන් ප්‍රත්‍යන්තයන් කළ යුතු කාර්යයන් කේන්ද්‍රය නොකළ යුතු ය යන මූලධර්මයට අනුකූලවන සේ භාවිතයට නැගිය යුතු ය; යන්තමින් නිර්වචනය කරන ලද හා ව්‍යතිරේක තත්ත්වයන් තුළ හැර (උදාඃ වෙන්වීම වැළක්වීම) ව්‍යවස්ථාදායක ශක්‍යතාවන්ගේ අඩුපාඩු සම්පූර්ණ කිරීමට අදාළව කේන්ද්‍රය විසින් රඳවා ගෙන තිබෙන විධායක බලතල ද වගවීමේ අවශ්‍යතාවන්ට යටත්ව, බෙදා හැරිය යුතු ය. අවසාන කාරණයේ දී  ගම්‍ය කරන පරිදි විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය බලය බෙදාහදා ගැනීමේ හා නූතන ප්‍රජාතන්ත්‍රවාදයෙහි කාර්ය සාධනීය බහුතල ආණ්ඩුකරණයේ අත්‍යවශ්‍ය උපකරණයක් ලෙස පළාත් ස්වායත්තතාවේ ආරක්ෂාවන් සඳහා සමගාමීත්වය පිළිබඳ සංකල්පය (අවශ්‍යයෙන්ම වත්මන් සමගාමී ලැයිස්තුව නොවුව ද) අත නැර තබා ගැනීම වෙනුවෙන් පෙනී සිටියි.

අවසාන වශයෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය නව බලය බෙදීමේ විසඳුම දහතුන්වන සංශෝධනයේ නිර්මාණ දෝෂයන්ට පිළියම් යෙදිය යුතුවා පමණක් නොව බලය බෙදීමේ විෂය පථය හා වපසරිය ගුණාත්මක වශයෙන් එය මගින් දැනට ලබා දී තිබෙන දෙය ඉක්මවිය යුතු ය යන මතයේ ස්ථිරසාරව සිටියි. පොලීසිය හා රාජ්‍ය ඉඩම් සම්බන්ධ බලතල ඇතුළුව බෙදන ලද බලතලවල අඩු කිරීමක් සිදු කළ නොහැකි ය යන්න ඉන් අදහස් වෙයි.

***දෙවන මණ්ඩලය***

පළාත්වලට  සැලකිය යුතු හා අර්ථවත් බලය බෙදීමක් දැකීමට කැමති වන්නා සේ ම විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ශ්‍රී ලාංකීය ජනතාවගේ හා ශ්‍රී ලංකා රාජ්‍යයේ අන්තර් රැඳියාව හා එක්සත් භාවය කෙරෙහි දැඩිව විශ්වාසය තබයි. ඒ අනුව රාජ්‍යයේ සංස්ථාපිත භෞමික මූලයන් අතර සහයෝගිතාව දිරි ගන්වන ආයතනික ව්‍යුහයන් නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ ගොඩ නැගිය යුතුව තිබේ යයි අපි දැඩි ලෙස විශ්වාස කරමු. මේවා අන්තර් ආණ්ඩු සබඳතා පටිපාටිවල සිට මුදල් හා මූල්‍ය සහයෝගිතාව දක්වා පරාසයක විහිදෙන අතර සමස්ත රටටම බලපාන නීති සම්පාදනයේ දී පළාත්වල හඬක් සහතික කරන්නා වූ මධ්‍යම ව්‍යවස්ථාදායක දෙවන මණ්ඩලයක් ඉතාම වැදගත් ආයතනවලින් එකක් වනවා ඇත. දෙවන මණ්ඩලයක් ව්‍යවස්ථාදායක ක්‍රියාවලියෙහි චින්තනය හා සවිචාරණය සහතික කිරීම මගින් ප්‍රජාතන්ත්‍රීය ආණ්ඩුකරණයේ අනෙකුත් අරමුණුවලට සේවය කරන්නා සේ ම අන් ආකාරයකින්  ප්‍රකාශයට පත් නොවන්නා වූ විශේෂඥ දැනුමේ නියෝජනය ද ලබා දෙනු ඇති බව නොකිව මනා ය. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය මෙම අවශ්‍යතා සපුරාලන දෙවන මණ්ඩලයක් සැලසුම් කරන්නට ඉල්ලා සිටින අතර එය පත්

කරනු ලබන මන්ත්‍රීන්ගෙන් හා පළාත් ව්‍යවස්ථාදායකයන් විසින් තෝරා පත් කරනු ලබන මන්ත්‍රීන්ගෙන් සමන්විත මිශ්‍ර එකක් විය යුතු යයි විශ්වාස කරයි.

***අවසන් කිරීමේ සටහන්***

2016 වසරේ දී අපේ තුන්වන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පැනවීමේ ආකර්ෂණීය බලාපොරොත්තුවට අපි මුහුණ දෙනු ලැබ සිටිමු. ඉහත සැකෙවින් සටහන් කරන ලද සාරධර්ම, ප්‍රතිමාන හා මූලධර්ම පිළිබිඹු කරන නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් උපකරණීයවාදයෙන්, විධායක පහසුතාවයෙන් හා පූර්ව ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා දෙකෙහිම ස්වභාව නිරූපිත නොඉවසීමෙන් නික්මීමක් සංස්ථාපනය කරනවා ඇත. එවැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් අපේ පොදු ප්‍රජාතන්ත්‍රවාදී උරුමය ශක්තිමත් කරනු ඇති අතර අපේ සමාජයේ පොහොසත් බහුත්වවාදය පූර්ණ වශයෙන් පිළිබිඹු කරනවා ඇත. මෙම සම්ප්‍රදායන් දෙකම ශක්තියේ මූලාශ්‍රයක් වන අතර ශ්‍රී ලාංකීය ප්‍රජාතන්ත්‍රවාදය හා සංවර්ධනය සඳහා බලාපොරොත්තු සහගත අනාගතයක් උදා කරනවා ඇත; ඒවා තවදුරටත් අතීතයේ දී බොහෝ විට සිදු වූ පරිදි දුර්වලතාවයේ, ආයතනික පරාභවයේ, ජනවාර්ගික සතුරුතාවයේ හා ගැටුමෙන් බෙලහීනත්වයට පත්වීමේ මූලයක් බවට පත් වන සේ නැවත වැරදියට කළමනාකරණය නොකළ යුතු ය.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය වෙනස යනු සාමාන්‍යයෙන් විකාශනීය ක්‍රියාවලියක් හා බලගතු ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රම කාලයක් මුළුල්ලේ වර්ධනීය ආකාරයෙන් ගොඩ නගනු ලැබ තිබෙන්නක් බව අපි දනිමු. ආනුෂාංගිකව නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අපේ සියලු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය පීඩාකාරී පරිශ්‍රමයන්ට කෝකටත් තෛලයක් වන්නේ යයි අපි අපේක්ෂා නොකරන්නේ වුව ද ප්‍රතිපත්තිමය නායකත්වය අපේ දේශපාලන සංවර්ධනයේ හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය විකාශනයේ මෙම ඓතිහාසික මොහොතේ දී දේශපාලන වශයෙන් විය හැකි බාධාවන් ඇතුළත විය හැකි වඩාම හොඳ ප්‍රතිඵලය සහතික කරනු ඇතැයි අපේක්ෂා කරමු. යුක්ති යුක්ත ප්‍රජාතන්ත්‍රීය නොඑකඟතාව නොවැලක් විය හැකිය යන්න හා 2015 දී වරක් නොව දෙවරක්ම ඡන්දදායකයා විසින් දෙන ලද ප්‍රජාතන්ත්‍රීයකරණයේ බලගතු පණිවිඩය නිරන්තරව සිතෙහි තබා ගෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයේ එළඹෙන ව්‍යවස්ථාමය කතාකාවන්හි දී හා ප්‍රචාරණයන්හි දී සංවරය, ඉවසීම, අවබෝධය හා වෘත්තීයභාවය භාවිතයට නගන්නයැයි අපි සියලුම දේශපාලන පක්ෂවලින් හා නායකයින්ගෙන් ඉල්ලා සිටිමු. හැම දෙනාටම ඔවුන්ට අවශ්‍ය කරන සියල්ල නොලැබෙනු ඇත. ව්‍යවස්ථාමය කතිකාවන්හි දී හැම විටම දෙන්නේ හා ගන්නේ කුමක් ද යන ප්‍රශ්නය පවතිනවා ඇත. එහෙත් ප්‍රතිපත්තිමය හා ප්‍රායෝගිකමය යන දෙකටම ප්‍රඥාසම්පන්න අවධානයක් යොමු කරන්නේ නම් අපේ තුන්වන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්පාදනය කිරීම අප භාර ගන්නා විට නව නිර්හීත දිශානතියකින් අපේ දේශපාලන හා පාලන සංස්කෘතිය පරිවර්තනය කිරීමේ විභවය ඊට තිබේ. දුශ් ව්‍යවස්ථාකරණවාදයේ හා දුශ් දේශපාලනයේ දශක ගණනාවකින් පසු ශ්‍රී ලංකාවේ ජනතාව අත් කර ගත් දෙයක් නොමැත.

**නිර්දේශ පිළිබඳ සාරාංශය**

1. **මූලික මූලධර්ම**: නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ශක්තිමත් ව්‍යවස්ථාමය ආණ්ඩුකරණයේ, බහුසංස්කෘතික පුරවැසිභාවයේ, ස්ත්‍රී පුරුෂ සමාජභාවී සාධරණයේ හා බහුත්ව ප්‍රජාතන්ත්‍රවාදයේ සාරධර්මවලට ගරු කිරීමේ ආපසු හැරවිය නොහැකි පදනමක් සලසන සේ එය පදනම්වන මූලික ප්‍රතිමානක මූලධර්මවල සංගත ප්‍රකාශනයක් අඩංගුකර ගත යුතු ය. මේවාට සමූහාණ්ඩුවාදයේ, නිර්ආගමිකවාදයේ, දේශපාලන බහුත්වවාදයේ, ව්‍යවස්ථාමය උත්තරීයත්වයේ, නීතියේ ආධිපත්‍යයේ, බලතල වෙන්කිරීමේ, බලය බෙදීමේ හා ප්‍රත්‍යන්තයන් කළ යුතු කාර්යයන් කේන්ද්‍රය නොකළ යුතු ය යන මූලධර්මයේ හා සියල්ලටමත් වැඩියෙන් මානව ගරුත්වයේ මූලධර්ම අඩංගු විය යුතු ය.

2. **බහුත්ව සමාජයක රාජ්‍යය**: ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාමය රාජ්‍යයේ ප්‍රධාන කාරණය හා කාර්යය වන්නේ හුදෙක් ජනවාර්ගික බහුතරය හෝ අනෙකුත් දේශපාලන බහුතරය නොව දේශපාලන ක්‍රමය සාමූහිකව සංස්ථාපනය කරන සියලු පුද්ගලයින් හා කණ්ඩායම් පිළිගන්නා, නියෝජනය කරන හා ඉඩ ප්‍රස්තා සලසන දේශපාලන ක්‍රමයක් සුරක්ෂිත කිරීම ය. එය සියලු ශ්‍රී ලාංකීය පුරවැසියන්ට හිමිකම හා රාජ්‍යයට කැපවීම පිළිබඳ අවබෝධයක් දිය යුතු ය.

3. **පාර්ලිමේන්තු ආණ්ඩුව**: ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය අයිතිවාසිකම්, යහ පාලනය, බහුත්වවාදය හා බලය බෙදීම සම්බන්ධ නිසි නෛතික ආරක්ෂණයන් සහිතව ව්‍යවස්ථාදායකය වෙත විධායකයේ අනවතර දේශපාලන වගවීම සහතික කරන්නා වූ සම්පූර්ණ වෙස්ට්මිනිස්ටර් මාදිලියක් වෙතට පෙරළා පැමිණෙන්නැයි අපි ඉල්ලා සිටිමු. නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදයේ හා දේශපාලන වගවීමේ ප්‍රධාන ආයතනය ලෙස ජාතික ජීවිතයෙහි කේන්ද්‍රීය ස්ථානයක පාර්ලිමේන්තුව ප්‍රතිෂ්ඨාපනය කරනවා දකින්නට අපි අපේක්ෂා කරමු.

4. **මැතිවරණ ක්‍රමය** : බහුත්ව සමාජයක නිසි ප්‍රජාතන්ත්‍රීය නියෝජනයට ඉතා වැදගත්වන සියල්ල වැළඳ ගන්නා සමානුපාතික නියෝජන ක්‍රමය ආරක්ෂා කරන අතරම කේවල ක්‍රමයේ යහපත් අංග ඒකාබද්ධ කරන මිශ්‍ර මන්ත්‍රී සමානුපාතික (MMP) ක්‍රමයක් ක්‍රියාත්මක කරන්නැයි අපි ඉල්ලා සිටිමු.

5. **අයිතිවාසිකම් පනත**: එක්සත් ජාතීන් විසින් පිළිගනු ලැබ තිබෙන ප්‍රධාන මානව හිමිකම් සාධන පත්‍ර දහයෙහි දක්වා තිබෙන ප්‍රමිතීන් සම්පූර්ණ වශයෙන් සපුරාලන්නා වූ හා ඒ ප්‍රමිතීන්ගෙන් ඔබ්බට පවා යන්නා වූ ද එසේම අදාළ ගිවිසුම් මණ්ඩලවලට බාධා විරහිත ප්‍රවේශය සලසන්නා වූ ද මූලික අයිතිවාසිකම් පිළිබඳ අළුත් ව්‍යවස්ථාමය පනතක් සකස් කරන්නැයි ඉල්ලා සිටිමු.

6. **ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණයඃ** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය අර්ථ නිරූපණය හා මූලධර්ම පිළිබඳ වැදගත් ප්‍රශ්නවලට අදාළ නඩු සම්බන්ධව පමණක් ක්‍රියා කරන ස්ත්‍රී පුරුෂ සමාජභාවය ඇතුළු ශ්‍රී ලංකාවේ සමාජීය හා කලාපීය බහුත්වවාදය නියෝජනය වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණයක් නිර්මාණය කරන්නැයි අපි නිර්දේශ කරමු. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ උත්තරීයත්වය පිළිබඳ මූලික මූලධර්මයේ ආරක්ෂකයා වනු ඇත.

7. **බලය බෙදීමඃ** බලය බෙදීම යනු හුදෙක් මධ්‍යම හා පළාත් ආයතනවල වඩා හොඳ තුලනයක් ඇති කිරීම පිණිස පළාත්වලට තීරණ ගැනීමේ බලතල පැවරීමම නොව වගකීම හා වගවීම බෙදීම මගින් බලය බෙදීම ඌනපූරණය කිරීම අදහස් කෙරෙන බලය බෙදීමේ නව ප්‍රවේශයක් අපි නිර්දේශ කරමු. වගකීම හා වගවීම බෙදාහදා ගන්නා එවැනි ප්‍රවේශයක් පළාත් සහ කේන්ද්‍රය එකට එක් කරනු ඇත. කේන්ද්‍රය හා පළාත් අතර සංගතික තුලනයක් ආරක්ෂා කරමින් ශක්නුතාවන්ගේ බෙදීම පළාත් ස්වායත්තතාව හා කාර්යසාධනීයත්වය ඉහළ නැංවීමේ දැක්මකින් යුතුව යළි විමසිය යුතු ය.

8. **දෙවන මණ්ඩලයඃ** භෞමික ඒකකයන් අතර සහයෝගිතාව පෝෂණය කරන හා ව්‍යවස්ථාදායක සවිචාරණය වැඩි දියුණු කරන දෙවන මණ්ඩලයක් සැලසුම් කිරීමට අපි නිර්දේශ කරමු. මෙම අවශ්‍යතා සපුරාලීම සඳහා එය ව්‍යවස්ථාදායක සභාව විසින් පත් කරනු ලබන විශිෂ්ට හැකියාවන්ගෙන් යුත් සාමාජිකයින්ගේ හා පළාත් ව්‍යවස්ථාදායක මණ්ඩල විසින් තෝරා පත් කරනු ලබන සාමාජිකයින්ගේ මිශ්‍රණයකින් සමන්විත විය යුතු ය.

*විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය*
*ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු*
*විධායක අධ්‍යක්ෂ*
*2016 ජනවාරි 22*